**දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - 2018**

**-------------------------------------------------------**

දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකුව, නෝඩික් සංවර්ධන අරමුදල් ණය හා චීන අපනයන හා ආනයන බැංකුව සමග එළඹි අංක 1711 එස්ආර්අයි (එස්එෆ්), අංක 2413 - එස්ආර්අයි, අංක එස්එල් - පී - 70, අංක එස්එල් - පී - 92, එන්ඩීඑෆ් 324, අංක බීඑල්ජී 201011 සහ අංක බීඑල්ජී 201012 දරන ණය ගිවිසුම් සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, කර්මාන්ත, සංචාරක, ධීවර හා කෘෂිකාර්මික යන අංශ දිරිගැන්වීම මඟින් දකුණු පළාතේ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා සහය වීමයි. ශ්‍රී ලංකාවේ ප්‍රථම ප්‍රවේශ පාලක අධිවේගී මාර්ගය ලෙස කිලෝමීටර් 126 ක දුර ප්‍රමාණයකින් බස්නාහිර පළාතේ කොට්ටාව සිට ගාල්ල නගරයට පිවිසෙන පිවිසුම් මාර්ගයත් සමඟ දකුණු පළාතේ මාතර දක්වාත් ඉදිවීම මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵලය විය. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 107,873 කට සමාන එ.ජ.ඩො.මිලියන 661.14 කි. දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා අරමුදල් සපයා ඇති ආකාරය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ණය ලබාදෙන නියෝජිතායතනය | එකඟවූ මුදල<br>එ.ජ.ඩො. මිලියන | ප්‍රතිශතය<br>% |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව | 186.00 | 28.13 |
| ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහාවූ ජපන් බැංකුව | 103.00 | 15.58 |
| නෝඩික් සංවර්ධන බැංකුව | 5.40 | 0.82 |
| ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන සංගමය | 0.80 | 0.12 |
| චීන අපනයන හා ආනයන බැංකුව | 138.21 | 20.90 |
| ශ්‍රී ලංකා රජය | 227.73 | 34.45 |
| **එකතුව** | **661.14** | **100.00** |

අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2014 වර්ෂයේ දී නිමකර තිබුණු අතර ඉදිකිරීම් වැඩ නිමකිරීමෙන් පසු, ණය මුදලෙන් ඉතිරිවන රු.බිලියන 4.40 ක් දක්ෂිණ අධිවේගී මාර්ගයට සෘජුවම හෝ වක්‍රව සම්බන්ධ වන ජාතික හා ප්‍රාදේශීය මාර්ග 14 ක් හා දකුණු පළාතේ පාලම් 2 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා උපයෝජනය කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය තීරණය කර තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2016 දෙසැම්බර් 31 වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂිත විය. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය 2018 දෙසැම්බර් 31 දින දක්වා පවත්වාගෙන ගොස් ඇති අතර එහි මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ

බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| කොන්ත්‍රාත්තුවේ කොන්දේසි 14.12 වගන්තියේ අවශ්‍යතා අනුව කොන්ත්‍රාත්කරුවන් 02 වෙත ගෙවිය යුතු එකතුව රු.මිලියන 194.67 ක රඳවා ගැනීමේ මුදල් අදාල කොන්ත්‍රාත්කරුවන්ගෙන් එකඟතාවය ලබා ගැනීමකින් තොරව මහා මාර්ගයේ පිරිවැයට එරෙහිව හිලව් කර තිබුණි. | ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වෙත වගකීමක් ඇති වීමට ඉඩ ඇත. | රඳවාගත් මුදල් නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරු ඉල්ලීමක් කර නොතිබුණි. එම නිසා 2018 වර්ෂයේදී අවසන් කිරීමේ ක්‍රියාවලිය තුලදී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරන ලද මහා මාර්ගයේ පිරිවැයට මාරුකර ඇත. | කොන්ත්‍රාත්තුවේ කොන්දේසි 14.12 වගන්තියේ අවශ්‍යතා අනුව අදාල කොන්ත්‍රාත්කරුගෙන් එකඟතාවය ලබා ගැනීම අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව භෞතික ප්‍රගතිය

බස්නාහිර පළාතේ කොට්ටාවේ සිට දකුණු පළාතේ පින්නදූව දක්වා කිලෝමීටර 95.05 ක් වූ කොටස ඉදිකිරීමේ කටයුතු 2006 වර්ෂයේ දී ආරම්භ කර තිබුණු අතර 2011 නොවැම්බර් 27 දින පොදු මහජනතාවගේ භාවිතය සඳහා විවෘත කර තිබුණි. අධිවේගී මාර්ගයේ පින්නදූවේ සිට ගොඩගම දක්වා අනෙක් කොටසේ කිලෝමීටර 30 ක ඉදිකිරීමේ කටයුතු 2011 වර්ෂයේ දී ආරම්භ කර තිබුණු අතර 2014 මාර්තු 15 දින පොදු මහජනතාවගේ භාවිතය සඳහා විවෘත කර තිබුණි. අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතුවල මුළු පිරිවැය රු.මිලියන 116,347 ක් විය. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| 2014 දී අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණද, ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ නිරාකරණය නොවූ ගැටළු හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර තිබුණි. ලැබී තිබුණු තොරතුරු අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවතපදිංචි කිරීමේ කමිටුවේ තීරණය යටතේ රු.මිලියන 3,928 ක අමතර ගෙවීමක් සහ වන්දි මුදල් නිරාකරණය කිරීමේ ප්‍රමාදයන් මත රු.මිලියන 347.98 ක පොළිය ඇතුළුව ඉඩම් කොටස් 9,595 ක් අත්පත්කර ගැනීම සඳහා 2018 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 6,766 ක් ගෙවා තිබුණි. තවද, 1986 අංක 13 දරණ ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවතපදිංචි කිරීමේ පනතේ 44 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ප්‍රදේශ 06 ක ඉඩම් කොටස් 569 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ලියාපදිංචි නොකර පැවතුණි. | ව්‍යාපෘති අධීක්ෂණ අරමුණින් අමතර පිරිවැයක් දරමින් ව්‍යාපෘතියේ කටයුතු පවත්වාගෙන යාමට ඉඩ ඇත. | අදහස් දක්වා නොමැත. | ඉතිරි කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කිරීම අවශ්‍ය වන අතර ව්‍යාපෘති නියාමන ඒකකයේ මෙහෙයුම් අවසන් කළ යුතුය. |